**බ්‍රිතාන්‍ය රජයේ මූල්‍ය සහාය භාවිතයෙන් ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය අදියර II (එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය) - 2014**

---

බ්‍රිතාන්‍ය රජය මූල්‍ය සහාය භාවිතයෙන් ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතියේ අදියර II (එක්සත් රාජධානි යකඩ පාලම් ව්‍යාපෘතිය) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජාතික අධිවේගී මාර්ගවල යකඩ පාලම් ඉදිකිරීම සඳහා සීමා සහිත හොන්කොන් සහ ෂැන්හායි බැංකු සහයෝගීතා පොදු සමාගම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2013 ජූනි 21 දින එළඹි අංක 53 එම්/එෆ්සී /1448 (201327/එස්එල්) දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග, වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

(අ) ග්‍රාමීය පාලම් 104 ක් සැලසුම් කිරීම,මැණුම් කිරීම හා සැපයීම,
(ආ) දේශීය සේවාවන් සහ දේශීය අමු ද්‍රව්‍යවලට දායකත්වය
(ඇ) වසර 4 කට වැඩි කාලයක් එක්සත් රාජධානි තාක්ෂණික සහය හා පුහුණුව ලබා දීම.

මගින් මාර්ග යටිතල පහසුකම් පුළුල් කිරීම සහ සවි බල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. පසුව 2014 අගෝස්තු 19 දිනැති කොන්ත්‍රාත් පැහැදිලි කිරීම් අංක 4 මගින් පාලම් 104 වෙනුවට පාලම් 88 ක් ආදේශ කර තිබුණි. ණය ගිවිසුමට අනුව, එක්සත් රාජධානියේ කොන්ත්‍රාත්කරුවෙකුට මුළු වටිනාකම ගෙවීමේ පදනම මත රු.මිලියන 9,778.05 කට සමාන ස්ටර්ලිං පවුම් මිලියන 45 ක පිරිවැයකට පාලම් සැපයීම හා සවිකිරීමේ කොන්ත්‍රාත්තුව 2012 අප්‍රේල් 26 දින පිරි නමා තිබුණු අතර සැලසුම් කිරීමට සහ පාලම් සවිකිරීමට සුදුසු තාක්ෂණික සහාය ලබා දීම කොන්ත්‍රාත්කරුගෙන් අපේක්ෂිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 19 දින ආරම්භ කර තිබුණු අතර වසර 4 ක් තුළ 2017 සැප්තැම්බර් 18 දින වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍යකරණ වාර්තාකරන ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) ශ්‍රී ලංකා මූල්‍යකරණ වාර්තාකරන ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට

කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බවත්ය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා මූල්‍යකරණ වාර්තාකරන ප්‍රමිතිවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම** | **අරමුදල් උපයෝජනය** | |
|---|---|---|---|---|---|
| | | | | **සමාලෝචිත වර්ෂය තුළ** | **2014 දෙසැම්බර් 31 දිනට** |
| | **එ.රා.පවුම් මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| දායකත්ව නියෝජිතායතනය | 45.00 | 9,778.05 | 4,626.00 | 4,625.98 | 6,125.98 |
| ශ්‍රී.ලං.ර | - | 2,500.00 | 500.00 | 171.38 | 289.58 |
| මා.සං.අ. ණය | - | - | - | 327.00 | 327.00 |
| | **45.00** | **12,778.05** | **5,126.00** | **5,124.36** | **6,742.56** |

සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලද රු. මිලියන 171.38 ක මුදලට අමතරව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය වානිජ බැංකුවකින් ලබා ගත් ණය මුදලක් මගින් රු. මිලියන 327 ක් ද ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. කෙසේ වෙතත් ණය ආපසු ගෙවීමේ විස්තර විගණනයට පැහැදිලි කර නොතිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය පහත දී ඇති වගුවෙන් පැහැදිලි කෙරේ.

| පාලම් වර්ගය | 2014 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීමට යෝජිත පාලම් | 2014 දෙසැම්බර් 31 දිනට ඉදි කරන ලද පාලම් ගණන | | |
|---|---|---|---|---|
| | | ස්ථිර | තාවකාලික | කෙරීගෙන යන වැඩ |
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| සංයුක්ත පාලම් | 1 | 1 | 0 | 0 |
| ක්ෂණික පාලම් | 5 | 1 | 0 | 4 |
| සී-200 පාලම් | 14 | 3 | 8 | 3 |
| ඩෙල්ටා පාලම් | 1 | 0 | 0 | 1 |
| ඇට්ලස් පාලම් | 5 | 1 | 0 | 4 |
| **එකතුව** | **26** | **6** | **8** | **12** |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) රේඛීය අමාත්‍යාංශය හා කොන්ත්‍රාත්කරු අතර අත්සන් කළ මූලික කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත් පැහැදිලි කිරීම් මගින් අවස්ථා 4 කදී වෙනස් කර තිබුණු බව නිරීක්ෂණය විය. එම නිසා මූලික කොන්ත්‍රාත්තුව අනුව මුළු පාලම් ගණන 104 ක් වු අතර එය පාලම් 88 ක් දක්වා අඩු කර ඇත. කෙසේ වෙතත් මූලික කොන්ත්‍රාත් ගිවිසුමට සිදු කළ වෙනස්කම් 04 න් 01 ක වෙනස්කමක් පමණක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්තුවේ මූලික වැඩ විෂය පථයේ නිරන්තර වෙනස් කිරීම් මගින් පාලම් ඉදිකිරීම සඳහා නිශ්චිත ස්ථාන, දිග, පළල සහ ප්‍රමුඛතාවයන් හඳුනා ගැනීමට ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය අසමත් වී තිබුණු බව පෙන්නුම් කෙරුණු අතර ඒ අනුව මූලික සැලසුම් වෙනස්කර තිබුණි.